**මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය - 2019**

මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) අතර 2018 ඔක්තෝබර් 04 දින එළඹි අංක. 6006 එල්කේ දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව, විනිමය සුරැකුම් කොමිසම සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මූල්‍ය වෙළඳපල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ පුද්ගලයන් අතර මූල්‍ය සේවා භාවිතය සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රතිඵල මත පදනම් වූ මූල්‍යකරණය තුළින් තෝරාගත් මධ්‍යම මට්ටමේ ප්‍රතිසංස්කරණ සඳහා සහාය වීම, නියාමකයින්ගේ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම, නෛතික හා නියාමන රාමුව වැඩිදියුණු කිරීම සහ මූල්‍ය වෙළඳපොළ යටිතල පහසුකම් නවීකරණය කිරීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය, වියපැහැදම් දර්ශක නම් වූ සංරචක 04 යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,125 කට සමාන එ.ජ.ඩො. මිලියන 75 ක් මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 ඔක්තෝබර් 18 දින ආරම්භ කරන ලද අතර 2022 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 මූල්‍ය කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණන නිර්දේශය |
| --- | --- | --- | --- |
| නියමිත පරිදි වියපැහැදම් සම්බන්ධ ප්‍රතිඵල අත්කර නොගැනීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ කටයුතු සඳහා අයවැය ඇස්තමේන්තුව අනුව වෙන් කර තිබුණු රු. මිලියන 680.4 ක මුදලින් සියයට 49 ක් හෙවත් රු. මිලියන 331.18 ක් පමණක් ව්‍යාපෘතිය විසින් භාවිතා කර තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම. | නියමිත පරිදි වියපැහැදම් සම්බන්ධ ප්‍රතිඵල අත්කර නොගැනීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් හේතුවෙන් වෙන් කළ ප්‍රතිපාදන අපේක්ෂිත පරිදි භාවිතා කළ නොහැකි විය. | අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අවශ්‍ය වේ. |

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | 2019 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය / විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණන නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය (ඒකක) | අත්කරගත් කාර්යය සාධනය (ඒකක) | | | | |
| වියපැහැදම් පිළිබඳ දර්ශක | වියපැහැදම් පිළිබඳ ප්‍රතිඵල (DLR) 12 | වියපැහැදම් පිළිබඳ ප්‍රතිඵල 02 | වියපැහැදම් පිළිබඳ ප්‍රතිඵල 10 ක් අත්කරගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම. | ව්‍යාපෘතිය ආරම්භ කිරීම ප්‍රමාද වීම හේතුවෙන්, ව්‍යාපෘති ඇගයීම් ලේඛණයේ සැලසුම් කළ පරිදි වියපැහැදම් පිළිබඳ ප්‍රතිඵල (DLRR) අත්කර ගැනීම ප්‍රමාද වී තිබුණි. තවද, 2020 අප්‍රේල් මාසයේ දී වියපැහැදම් සම්බන්ධිත ප්‍රතිඵල අත්කර ගත් දිනය සම්බන්ධයෙන් මූල්‍ය ගිවිසුමට සංශෝධනයක් කර තිබුණි. | අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අවශ්‍ය වේ. |